මගේ අංකය: JSC/SEC/CIR/2021

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,

<u>නඩු භාණ්ඩ භාර ගැනීම තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධව දැන්වීම</u>

උක්ත ශීර්ෂය යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ රස පරීක්ෂක ජී. රමනා මහතා/මහත්මිය විසින් මට ද පිටපතක් සහිතව පොලිස්පති වෙත යොමු කර ඇති අංක GAD/AD-05/COVID-19 සහ 2021.02.22 දිනැති ලිපිය ඔබගේ අවධානයට ලක්කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2021 පෙබරවාරි මස 24 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்
GOVERNMENT ANALYST'S DEPARTMENT

අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
இல. 31, இசுறு மாவத்தை, பெலவத்த, பத்தரமுல்ல.
No. 31, Isuru Mawatha, Pelawatta, Battaramulla.
SRI LANKA.

දුරකථන / தொலைபேசிகள் / Telephones: 011 - 2786395, 011 - 2176800
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2786394
E-mail : govanalyst@sltnet.lk

මගේ අංකය / எனது இல. / My No.: GAD/AD-05/COVID-19
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2021.02. 22

23 FEB 21

පොලිස්පති,
පොලිස් මූලස්ථානය.

<u>නඩු භාණ්ඩ භාරගැනීම තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධව දැන්වීම</u>

මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරී කල තලංගම පොලිස් ස්ථානයේ නිලධාරියෙකු 2021.02.12 දින කරන ලද පී.සී.ආර්. පරීක්ෂණයට අනුව කොවිඩ් - 19 රෝගියෙකු බව හඳුනාගන්නා ලද අතර ඉන් අනතුරුව ඔහුගේ සමීපතමයින් වශයෙන් හඳුනාගත් දෙපාර්තමේන්තු ආරක්ෂක අංශයේ සාමාජිකයින් සහ පොලිස් නිලධාරීන් නිරෝධායනය කරන ලදී.

02. ඔවුන්ගේ පළමු පෙළ ආශ්‍රිතයින් ලෙස දෙපාර්තමේන්තුවේ නඩුභාණ්ඩ භාරගන්නා ස්ථානයට අනුයුක්තව සේවය කල සංවර්ධන නිලධාරීන් හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන් දස දෙනෙකු (10), 2021.02.21 දින පී.සී.ආර්. පරීක්ෂණය සඳහා යොමු කරන ලදී. ඒ අතුරින් නඩුභාණ්ඩ භාරගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටි සංවර්ධන නිලධාරී මහත්මියක් කොවිඩ් - 19 රෝගියෙකු ලෙස හඳුනාගනු ලැබිණි. එම නිලධාරිනිය සමඟ නඩු භාණ්ඩ භාරගැනීමේ ක්‍රියාවලිය තුළ නිරතව සිටි නිලධාරීන් දහසයදෙනෙකු (16) අද දින, එනම් 2021.02.22 දින පී.සී.ආර්. පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ.

04. දෙපාර්තමේන්තුවේ නඩුභාණ්ඩ භාරගන්නා අංශය විශබීජහරණය කර නැවත යථා තත්වයට පත්කිරීමට දැනටමත් කටයුතු කරගෙන යනු ලැබේ. එමෙන්ම අද දින පී.සී.ආර්.පරීක්ෂණ වලට යොමු කරන ලද එම අංශයට අදාල නිලධාරීන්ගේ වාර්තා ලැබෙන තෙක් අදාල රාජකාරී කටයුතු ඉටුකිරීමට නොහැකි වන අතර 2021.02.23, 24 හා 25 යන දින 03 තුළ නඩුභාණ්ඩ භාරගැනීමේ කාර්යය පමණක් තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි. ඒ පිළිබඳව සියළු පොලිස් ස්ථාන කඩිනමින් දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

ජී.රමනා
ආණ්ඩුවේ රස පරීක්ෂක

පිටපත - ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - කරු.දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

ජී. රමනා
ආණ්ඩුවේ රස පරීක්ෂක